

# සිනමාවේ ඉතිහාසය

චිත්‍රපටයේ මූලික පදනම චලන චිත්‍රයයි. බොහෝ දෙනකු චලන චිත්‍රයේ ඉතිහාසය වසර 100 ක් 200ක් පමණ යැයි සිතා සිටිය ද එය අසත්‍යයකි.

සත්‍ය වශයෙන්ම චලන චිත්‍රයේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව 20000-13000 අතර කාලය දක්වා දිව යයි.

එනම් නෝවේ, ලැස්කෝ සහ අල්ටමීරා ගුහාවල චිත්‍ර ඇඳි කාලය දක්වා දිවයයි. ප්‍රංශයේ ලැස්කෝ ගුහාවල (ක්‍රි.පු. 20000-13000) චිත්‍රවල ගවයන් ගේ රූප සහ ඒ ගවයන් දඩයම් කිරීමට සැරසෙන දඩයක්කරුවන් ගේ රූප ද චලන ස්වරූපයෙන් චිත්‍රණය කර ඇත.


ස්පාඤ්ඤයේ අල්ටමීරා හා නෝවේ ගුහාවල චිත්‍ර ද මෙයට සමාන ව අපූර්ව ලෙස සතුන් ගේ ඉරියව් ස්වාභාවික ව දක්වා ඇත. ඉරියව්වල නිරවද්‍යතාව පිළිබඳ නිදසුනක් ලෙස ඇල්ටමීරාවේ ඇති තුවාල වූ බයිසන් ගවයකු ගේ චිත්‍රය දැක්විය හැකි ය. සතුන් ගේ චලනය මෙන් ම මිනිසා ගේ චලනය කෙරෙහි ද ආදී මානවයා ගේ අවධානය යොමු වී තිබේ.

අභිචාරාත්මක රංගනයක් නිරූපණය වන ක්‍රි. පු. 10000 කාලයට අයත් ශෛලමය කාවැද්දීමක් (rock engraving) සිසිලියේ ඇඩන්රා ගුහාවලින් හමු වී තිබේ. එහි දැක්වෙන නර්තන රටා නව චලනයේ රටා පිළිඹිබු වේ. මෙසපොතේමියාවෙන් හා මිසර ශිෂ්ටාචාරවලින් හමු වී ඇති ඇතැම් චිත්‍රවල ද චලනයට අදාළ මානව හැඟීම් ප්‍රකාශ වේ. තව ද මීට අමතර ව ඉන්දු නිම්න හා චීන ශිෂ්ටාචාරවලින් හමු ව ඇති ඇතැම් චිත්‍ර හා රූපාක්ෂරවලින් ද චලනය ගැන ආදී මානවයා ගේ උනන්දුව පැහැදිලි වේ.

චලන චිත්‍රය ගැන කථා කිරීමේදී සෙවනැලි නාට්‍ය වලට ද ප්‍රධාන ස්ථානයක් හිමි වේ. 11වැනි හා 13වැනි සියවස් අතර කාලයේ ජන කලාවක් ලෙස ප්‍රචලිත මේ නාට්‍ය සඳහා මුලදී ශාක පත්‍ර හා ලී කැබලි ශරීරාංග සෙවනැලි නිර්මාණය සඳහා භාවිත විය. පසු කාලයක දී ඒ සඳහාම විශේෂිත රෙදි කැබලි සම් යනාදිය යොදා ගැනිණි. බැටළු හම් වානර උදර කොටස් ආදියෙන් ලබාගත් සියුම් හම් හොඳින් තුනී

වන සේ ඇඳීමෙන් සකස් කෙරුණු එම රූපවලට විනිවිද පෙනෙන සුළු තෙල් සායම් ගල්වා වර්ණ සෙවණැලි රූප ද නිර්මාණය කරනු ලැබී ය. චීනය මුල් කරගෙන මේ සෙවනැලි නාට්‍ය කලාව වර්ධනය වූ අතර චූසි රාජ්‍ය සමයේ ලී නමැති කාන්තාව සුදු තිර මත සෙවනැලි රූප පෙන්වීමට ප්‍රසිද්ධියක් උසුලා ඇත.

සෙවනැලි නාට්‍යවලට වඩා චිත්‍රපටයට සමීප ලක්ෂණ සහිත නැරඹුම් ක්‍රමයක් අතීතයේ දී පෙරදිග හා අපරදිග රටවල ද පැවැති බවට 13වැනි සියවසේ පමණ සිට සාක්ෂි හමු වේ. එහිදී ස්ත්‍රී නිරුවත් රූප සහිත කඩදාසි එකට තබා වේගයෙන් පොතක පිටු ආකාරයෙන් පෙරළීමෙන් චලනය වන රුවක් ලබා ගැනීමට නිර්මාණකරුවා ක්‍රියා කර ඇත. තව ද අතීත ප්‍රභූවරුන් හා ධනවතුන් රෝල කරකවන ක්‍රමයකට චිත්‍රපටවලට සමාන නිර්මාණ නරඹා තිබේ. ඒවා අඳින ලද චිත්‍ර රෝලක් සකසා එය සේවකයකු විසින් කරකැවීම එක් ක්‍රමයකි. අඳුරු කුටියක් තුළ දී තුනී පටලමය කඩදාසිවල හෝ වෙනත් පාරදෘශ්‍ය ව්‍යුහයක අඳින ලද චිත්‍රවලට එළි දහරා නිකුත් කිරීම අනෙක් ක්‍රමයයි. මේවායේදී වැඩි වශයෙන් භාවිත වී තිබුණේ ස්ත්‍රී රූපයි.




16 වන සියවසේදී අපට නැවත චලන චිත්‍රය ගැන අන්නට ලැබේ. ඒ යුරෝපයේ තිබූ Filip Books නමැති කුඩා පොත් විශේෂයක් මගිනි. ජර්මනියේ මෙය Thumb Cinema ලෙස හඳුන්වයි. මෙහි එක් පිටුවක එක් රූපයක් බැගින් අනුක්‍රමික රූපාවලියක් විය. ශෘංගාරාත්මක චිත්‍රවලින් සමන්විත මෙහි පිටු වේගයෙන් පෙරළීමට සැලැස්වීමෙන් ස්ත්‍රී පුරුෂ මෛථුනයන් ගේ විවිධ ක්‍රියා චලනය වන්නා සේ දර්ශනය විය. මෙසේ නිපද වූ පොතක් පිටු 48කින් පමණ සමන්විත විය. පොතක පිටු පෙරළිය හැක්කේ තත්පරයට පිටු 4-6 අතර වේගයකිනි. මේ අනුව එම ශෘංගාර පොත් පෙරලූ අය තත්පර 6ක් පමණ දිගු කාලයක් ඇති චලන චිත්‍රයක් දකින්නට ඇත.

චලන ප්‍රති නිර්මාණය කරන සිනමාව නම් වූ කලා මාධ්‍ය බිහිවීමට මුල් වූ ප්‍රධාන සාධක 3ක් ඇති බව විද්වතුන් ගේ මතයයි.

1. ආලෝකය භාවිතයෙන් ප්‍රතිබිම්බ ප්‍රක්ෂේපණය (උදා-කැමරා ඔප්සිකියුරාව)
2. දෘෂ්ඨික අඛණ්ඩතාව (persistence of vision) නමැති සංසිද්ධිය
3. ඡායාරූප ශිල්පයේ බිහිවීම.

කැමරාව බිහිවීම 19 වන සියවසේ මුල්භාගයේ දී සිදු වුව ද එහි මූලය ඉන් එපිට විහිදී යයි. නූතන කැමරාවේ ආදිතමයා ලෙස සැලකෙන ඔප්සිකියුරාව පිළිබඳ ව ඩාවින් පවා පවසා ඇත. ඔප්සිකියුරාව පෙට්ටියක හැඩයක් ගත් උපකරණයයි.

මේ පෙට්ටියේ ඇති සිදුරකින් වස්තුවේ සිට ආලෝකය ඇතුළට පැමිණෙන අතර එමගින් වස්තුවේ ප්‍රතිබිම්බයක් පෙට්ටියේ ඉහළ තිරයකට ලබා දේ. මෙය ලතින් බසින් අඳුරු කාමරය යන අරුත දෙයි. ඔප්සිකියුරාව පිළිබඳ අදහස පළමුවෙන් ඉදිරිපත් කරන ලද්දේ ක්‍රි. පූ. 5වැනි සියවසේ චීනයේ විසූ දාර්ශනිකයකු වූ මෝට් ය. ඔහු හැඳින්වූයේ එක් කිරීමේ ස්ථානය: Collection Place) හෝ අගුළු ලන වස්තු කැටි ය: Locked Treasure Room) යනුවෙනි. ක්‍රි. පූ. 384-822 කාලයේ විසූ ඇරිස්ටෝටල් ද මෙහි මූලධර්මය දැන සිටි බව කියවුන ද නූතන කැමරා ඔප්සිකියුරාවේ නිර්මාතෘ ලෙස සඳහන් වන්නේ ක්‍රි. ව. 965-1039 අතර කාලයේ විසූ ඉස්ලාමීය විද්වතකු වන අල්හසීන් ය.

මීළඟට චලන චිත්‍රය ගැන කතා කිරීමේදී වැදගත් උපකරණයක් වන්නේ මැජික් ලන්තෑරුමයි. මෙය ප්‍රාථමික මට්ටමේ ප්‍රක්ෂේපණ උපකරණයක් වන අතර වර්තමාන ප්‍රොජෙක්ටරයේ පුරෝගාමියා ලෙස ද හැඳින් වේ. 17වැනි සියවසේ බිහි වූ බව කියන

මැජික් ලන්තෑරුමේ ආලෝක ප්‍රභවය ලෙස මුල් කාලයේදී ඉටිපන්දම් හෝ ලාම්පු ද 1780 දී ආගන් ලාම්පු ද 1820 දී Lime Light 1850 දී විද්‍යුත් තාප පහන ද භාවිතා කළේ ය. 1820 දශකය වන විට ප්‍රසිද්ධ ස්ථානවල මැජික් ලන්තෑරුම් දර්ශන පැවැත්වීම එංගලන්තයේ බහුල ව සිදු විය.

ලන්ඩනයේ රීජන්ට් වීදියේ රෝයල් පොලිටෙක්නික් ආයතනයේ දී මෙවැනි දර්ශන නිතරම පැවැත්විණි.

1882 දී ප්‍රංශ ජාතික වෛද්‍යවරයකු වූ ජූල්ස් මරේ විසින් කැමරා තුවක්කුව නිපද වුණු අතර එය ද සිනමාව තැබූ තවත් පියවරක් විය. මේ උපකරණය මඟින් තත්පරයක දී රූපරාමු 12 ක් පිළිවෙලින් ලබා ගත හැකි ය. එය තුවක්කුවේ කොකා ඇදීම මඟින් සිදුකරයි. තව ද 1878 දී බ්‍රිතාන්‍ය ජාතිකයකු සිට පසුව අමෙරිකානු ජාතිකයකු බවට පත් ව එඩ්වඩ් මයිබ්‍රිජ් පැන දුවන අශ්වයකු පාද හතරම කිසියම් අවස්ථාවක දී පොළොවේ නො ගැටෙන අවස්ථාවක් ඇද්ද යන්න සෙවීම සඳහා කැමරා 24ක් එක පෙළට තබා අශ්වයන් දිවීම ඡායාරූප ගත කළේ ය.

ඔහු මේ ඡයාරූප භ්‍රමණ තැටියකට නංවා මැජික් ලන්තෑරුමක භාවිත කරමින් තිරයක් මතට ප්‍රතිබිම්භ ලබා ගත් අතර, චලන චිත්‍ර ඡායාරූපකරණය පිළිබඳ අදහස ද ලොවට එක් කළේ ය.

පළමුවෙන් ලෝකයට ප්‍රායෝගික වශයෙන් භාවිත කළ හැකි චලන චිත්‍ර කැමරාවක් සහ ඒ රූප නැරඹීමට මෙවලමක් ද නිම වූයේ තෝමස් එඩිසන් සහ ඔහු ගේ සහායක විලියම් ඩික්සන් ය. එම යන්ත්‍රය කිනෙතොස්කෝප් නමින් හැඳින්විය. එඩිසන් මේ යන්ත්‍රයට දැමීමට අවශ්‍ය චිත්‍රපට නිෂ්පාදන සඳහා චිත්‍රාගාරයක් ද සකස් කළේ ය. 1893දී බටහිර ඔරේන්ජ් හි ගොඩ නඟන ලද මේ චිත්‍රාගාරය ලොව පළමු සිනමා චිත්‍රාගාරයයි.

මෙය බැලැක්මාරියා නමින් හැඳින්වෙයි. යුරෝපයේ බොහෝ රටවල විවිධ විද්‍යාඥයන් එඩිසන් ගේ අදහස්වලින් නව යන්ත්‍ර නිපදවීම ආරම්භ කළේ ය. ඒ අතර ප්‍රංශයේ ලුමියර් සහෝදරයන් 1895 දෙසැම්බර් මස 28 වන දින ප්‍රංශයේ පැරිස් නුවර ග්‍රෑන්ඩ් කැෆේ ශාලාවේදී ඔවුන් නිපද වූ තත්පරයට රූප රාමු 16 ක වේගයකින් යුක්ත වූ සිනෙමැටොග්‍රාප් (cinematograph) නම් උපකරණය භාවිතයෙන් ලොව ප්‍රථම මහජන සිනමා දර්ශන පවත්වන ලදී. එහෙත් මෙහි අලුත් ගතිය වැඩිකල් නො පැවතුණි. මේ නිසා චලන චිත්‍ර මඟින් කථාවක් කිය හැකි බව පෙන්වා දෙමින් ප්‍රංශයේ 'ඇලිස් ගයිබ්ලාජ්', 'ද කැබේජ් ෆෙයරි' නමින් කළ විනාඩියක චිත්‍රපට චලන චිත්‍රයට නව මඟක් කියා දුනි.

විජ්ජාකරුවකු හා චිත්‍රපට නිෂ්පාදකයකු වූ 'ජෝජ්මෙලියස්' 1902 දී 'අ ට්‍රිප්ටු ද මූන්' නමින් තාක්‍ෂණික වශයෙන් උසස් නිර්මාණයක් නිර්මාණය කොට සංස්කරණය මුලින්ම ලොවට හඳුන්වා දුන්නේ ය. මේ කාලයේ දී ඇමරිකාවේ විවිධ ස්ථානවල 'නිකලඩ්ස්' හෝ 'නිකලෝඩියන්' නමින් හැඳින් වූ 50 සිට 90 දක්වා වාඩි වී චිත්‍රපට නැරඹිය හැකි ශාලා බිහි විය. චිත්‍රපට සෑදීම සඳහා සමාගම් අමෙරිකාවේ නිව්යෝර්ක් සහ නිව්ජර්සි නගර ආශ්‍රිතව බිහි විය.

1899-1900 කාලයේදී ප්‍රංශයේ ප්‍රමුඛතම චිත්‍රපට නිෂ්පාදකයා වූයේ 'ජෝර්ජ් මෙලියස්' ය. 1900 දී 'චාල්ස්පාතේ' ද චිත්‍රපට නිෂ්පාදනයට යොමු වූ අතර ඔහු ගේ සමාගම 1905 වන විට ලෝකයේ චිත්‍රපට සමාගම විය. එංගලන්තයේ ප්‍රථම විශාල චිත්‍රපට නිෂ්පාදකයා 'සිසිල් හෙප්වර්ත්' ය. එහෙත් 1914දී 1 වැනි ලෝක යුද්ධය ඇතිවීමත් සමඟම අමෙරිකාවට සිනමාවේ පරම අයිතිය ලැබුණි.

මීළඟට සිනමා ඉතිහාසයේ නො මැකෙන නමක් සටහන් කළ ඩේවිඩ් වාක් ග්‍රිෆිත් ගේ ආගමනය සිදු වේ. 1907 දී 'රෙස්කියුඩ් ෆ්‍රොම් ඇන් ඊගල්ස් නෙස්ට්' (උකුසු කූඩුවකින් මුදා ගත්තා) රඟ පෑ අතර 1908 දී ඔහු සිය ප්‍රථම චිත්‍රපට වන 'අඩ්වෙන්චර්ස් ඔෆ් ඩොලී' අධ්‍යක්ෂණය කළේ ය. මෙතැන් සිට වසර 10 පමණ මොහු 'බයොග්‍රාෆ්' සමාගම සමඟ කටයුතු කළේ ය. ග්‍රිෆිත් ගේ සාර්ථකම චිත්‍රපටය ලෙස පිළිගැනෙන්නේ 'Birth of Nation' ය. ඔහු ගේ 'Intolerence' නම් වූ චිත්‍රපටය ද ඉතා විශිෂ්ට මට්ටමේ ලා සලකනු ලැබේ.



ග්‍රිෆිත් විසින්,

1. අන්තර් ඡේදනය
2. ක්ෂණික ඡේදනය
3. කාච විවරය අඩුවැඩි කිරීම
4. කාච ආවරණය යෙදීම
5. රාත්‍රී දර්ශන රූගත කිරීම
6. කැමරා සැකසීම
7. කැමරාව තිරස් ලෙස හැසිරවීම
8. කැමරාව වස්තු වෙත ධාවනය
9. අතිසමීප රූප යොදා ගැනීම
10. අතීතාවර්ජනය

යන ශිල්ප ක්‍රම සිනමාවට දායාද කළේ ය.

මීළඟට ග්‍රිෆිත් ගේ සමගාමිකයකු වන ලෝක සිනමාවේ වැදගත් ස්ථානයක් මෙන්ම ලෝක සිනමාව නව මඟකට යොමු කළ චරිතයක් හමු වේ. ඔහු නමින් 'චාලි චැප්ලින්' ය. එංගලන්තයේ ඉපිද අමෙරිකාවට සංක්‍රමණය වූ මොහු විකට සිනමාවේ රජු යන විරුදාවලියෙන් පිදුම් ලබයි. මුලදී නළුවෙකු ලෙස සිය සිනමා ජීවිතය ඇරඹූ පසුව සිනමා අධ්‍යක්ෂණයට ද පිවිසියේ ය. Woman of Paris (1923) Gold Rush (1925) The Circus ඔහු ගේ වැදගත් ම නිර්මාණ අතර වේ.

ග්‍රිෆිත් නතර කළ තැන සිට එම සිනමා සම්ප්‍රදාය නැවත පටන් ගන්නා ලද්දේ 'සර්ජි අයින්සටයින්' ය. ඔහු චිත්‍රපට අධ්‍යක්ෂවරයකු පමණක් නොව සිනමා සිද්ධාන්තවේදියකු ද වේ. මොහු ගේ විශිෂ්ටතම නිර්මාණය Battleship potemkin වන අතර බොහෝ දෙනෙකු එය සිනමාවේ ව්‍යාකරණ ග්‍රන්ථය ලෙස ද ගුරු අත්පොත ලෙස ද විස්තර කරයි. ඔහු තම ප්‍රථම සිනමා සිද්ධාන්ත නිබන්ධනය වන The Montage of Attraction ලියුවේ 1922-23 කාලයේදී 'කැලෙෂොව්' යටතේ හැදෑරීම් කරන කාලයේදී ය. එසේම Montage ශෛලියේ නිර්මාතෘවරයා වන්නේ ද මොහු ය.

මෙසේ සිනමාව සීඝ්‍රයෙන් දියුණු වන විට 1927දී නිහඬ සිනමාව නිමා කරමින් 'Alan of Land' අධ්‍යක්ෂණය 'Jazz Singer' නම් කතා නාද චිත්‍රපට බිහි වී ය. මෙසේ කතා නාද චිත්‍රපට ඇරඹීමත් සමඟම ප්‍රංශයේ ප්‍රථම කතා නාද චිත්‍රපටය ලෙස Rene Clairගේ Sous Les Poils de Paris (1929) තිරගත විය. මේ අවධියේ දී චිත්‍රාගාර යුගය ද ඇරඹිණි. මේ යුගයේදී සිනමාවේ සියලුම කටයුතු පාලනය කරනු ලැබුයේ ප්‍රධාන චිත්‍රාගාරය මඟිනි. අමෙරිකාවේ ප්‍රධාන චිත්‍රාගාර හෙවත් Big 5 වූයේ Warne, Brs, Loew, MGM, FOX, Paramount, MRKO යන සමාගම් ය. මෙසේ දීර්ඝ කාලයක් පැවැති චිත්‍රාගාර සමය 1942 පමණ අඩපණ වූ අතර 1950 පමණ සම්පූර්ණයෙන්ම නම අහෝසි විය. මේ වන විට වර්ණ චිත්‍රපට කර්මාන්තය ද දියුණු මට්ටමක තිබුණු අතර ලෝකය පුරාම සිනමාව නමැති කලා මාධ්‍ය ව්‍යාප්ත ව තිබුණි. ■

**මාධව එදිරිසිංහ**

> මොහු ගේ විශිෂ්ටතම නිර්මාණය Battleship Potemkin වන අතර බොහෝ දෙනෙකු එය සිනමා වේ. ව්‍යාකරණ ග්‍රන්ථය ලෙස ද ගුරු අත්පොත ලෙස ද විස්තර කරයි.

PERMANENT REFERENCE
Library